# දඟ පන්දුව




මොකද පන්දුක තමුසෙ කවදාවත් නැතුව සුදු ඇඳගෙන..? මූණත් බෙරි කරගෙන සතපහ වගේ.. මොකද්ද ඒ ගමන නටන්න හදන නාඩගම..?

නෑ ජගිරි මහත්තයා.. අපි මේ මළ ගෙයක් ප්ලෑන් කළා..ඒකයි මේ සුදු ඇඳ ගත්තෙ ..

මාර අපබ්‍රංසයක්නෙ ඔහේ කියන්නෙ.. කොහොමද මළ ගෙවල් ප්ලෑන් කරන්නෙ..? කවුරු හරි මැරුණම ඒ ඒ වෙලාවට ඒවා ඒ හැටියට කරනවා ඇරෙන්න..

නෑ ජගිරි මහත්තයා.. ලංකාවෙ පාපන්දු සංගමය වෙනුවෙන් අපි මේක ප්ලෑන් කළේ එතකොටවත් රටේ ලෝකෙ මිනිස්සුන්ගෙ ඇස් ඇරෙයිද බලන්න..

දැන් මොකද ඔය පාපන්දු වලට වෙලා තියෙන්නෙ..? තමුසෙ පාපන්දු බලන්න කියලා පහුගිය දවස් වල ලංකාවටත් ගියානෙ..

කියල වැඩක් නෑ.. අසබාලන කනවා.. වටේ තියෙන චූටිත්තන් රටවල් වලිනුත් කනවා.. ලැජ්ජාවෙ බෑ.. ඒ දවස්වල ඒ කිව්වෙ එක්දාස් නවසිය අනූ ගණන් වල අපි මාලදිවයිනට පාපන්දු ඉගැන්නුවා.. දැන් උන් අපට ගහනවා.. කියලා වැඩක් නෑ.. මාලදිවයින විතරක් නෙවෙයි.. භූතානය.. නේපාලය.. හැම රටක්ම අපිව පහුකරගෙන කොචොක් එක දාගෙන යනවා.. ඉතින් පාපන්දු සංගමය භූමදානය කරනවා ඇරෙන්න වෙන මොනාද කරන්න තියෙන්නෙ..?

මට හිතෙන්නෙ ලංකාවට මුදල් නැතුව ඇති පාපන්දු දියුණු කරන්න...

සංක්‍රමණ මහත්තයා ඉතින් මුදල් ගැනමනෙ හොයන්නෙ.. මම ඒකත් හොයලා බැලුවා.. ලංකාවෙ පාපන්දු වලට ජගත් පාපන්දු සම්මේලනයෙන් ලැබෙන මුදල් කන්දරාව ක්‍රිකට් වලට වඩා කීප ගුණයක් කිව්වුවොත් කවුරුත් විශ්වාස කරන එකක් නැහැ..

අනේ අම්මපා කව්ද මේ සල්ලි පාලනය කරන්නෙ.. සුගතදාස පිට්ටනිය ඇරෙන්න කොල්ලන්ට පිට්ටනියක්වත් නැනෙ සෙල්ලම් කරන්න.. කවුරු හරි මේ සල්ලි නාස්ති කරනවා ඇති..

නාස්ති කරන එකක් නං මං දන්නෙ නෑ.. අපේ පාපන්දු ලොක්කා මහිලාල් ලංකාවෙ පෙරිය සයිස් ධනවතෙක්.. හැරි අයියලා එක්ක බිස්නස් කරන්නෙ..

මොනව කිව්ව පංදුක.. අර කලුතර උසාවියෙ නඩු වලට කතා කර කර හිටිය යහපත් මනුස්සයා නේද?

ඔව්.. ඔව්.. සංක්‍රමණ මහත්තයා.. සෙල්ලන් නෑ.. පහුගිය අවුරුදු ගරාණක ඉඳන් ආසියානු පාපන්දු සම්මේලනයේ උප සබාපති හැටියට කටයුතු කරන්නෙත් එතුමාම තමයි..

මම නං කියන්නෙ මේ ගැන හොයන්න කමිටුවක් පත් කරන්න ඕනෙ කියලයි..

ඒ යොජනාව ගෙන ආවේ කවදත් කිරීඩාවට ඒ හැටි කැමැත්තක් නොදක්ව මැදපාලුගේ මහතා යි.

මැදපාලුගේ මහත්තයට කියන්නෙ අපි මේ මළ ගේ සංවිධානය කරන්න කළින් කළේ කමිටුවක් පත් කරන එකයි. ඒ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න නම් ඒ තරම් ලේසි නෑ. ඒකයි අපි කල්පනා කළේ අඩු වියදමකින් ෆියුනරල් එකක් කරලා වැඩේ අමතක කරලා දාලා හිත හදාගන්න..

හරි හරි.. ඉතින් ඔය කිමිටුවෙන් ලැබුණ නිර්දේශ කියමුකො බලන්න.. අපටත් දැනගන්න..

නිර්දේශ අංක 1

දිවයින පුරා විසිරී ඇති පාපන්දු ක්‍රීඩකයන්ට කකුල් ලබා දිය යුතුයි..

කරන්න පුලුවන් වැඩක්ද ජගිරි මහත්තයා.. මාසෙකට 600 ක් අබ්බගාතයන් බිහිකරන අපේ රටේ ඒ අයටවත් කකුල් දෙන්න බැරිව ඉන්න අපට..

නිර්දේශ අංක 2

පාපන්දු පරිපාලකයන්ට මොලේ ලබා දෙන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

ඒකත් කරන්න පුලුවන් වැඩක්ද? මොන විදිහකින් හරි ට්‍රාන්ස්ප්ලන්ට් එකක් කරලා ඒ වැඩේ කළයි කියමුකෝ.. ඒත් රටේ පාලකයන්ට මොලේ නැති නිසා මේ නිලධාරීන් පාලනය කිරීම ඊලඟට ප්‍රශ්නයක් වෙනවා..

නිර්දේශ අංක 3

පාපන්දු සංගමයේ මුදල් පාලනය මාලදිවයින හෝ වෙනත් රටකට හෝ පැවරීම

ඒක නම් කොහොමටවත් කරන්න බෑ.. එහෙම කළාම අපේ රටේ නිවහල් නිදහස් ස්වයිරී බාවයට මොකද වෙන්නෙ..?

මේ සේරම දේවල් කල්පනා කරළා තමයි මේ තීරණේ ගත්තෙ .. ජගිරි මහත්තයයි සංක්‍රමණ මහත්තයයි මැදපාලුගේ මහත්තයයි තුන් දෙනාම පුලුවන් නම් මේ අවමගුලට සහභාගි වෙන්න කියලා මං ආරාදනා කරනවා..

අපට පරක්කු වෙනවා.. අවමගුල් බැරි නම් ඕනෙ මගුලක් කරගන්නවා.. කියමින් ඔවුන් තිදෙනාම එතැනින් මාරු වී ගියේ වෙනදා මෙන් කේන්තියකින් නම් නොවෙයි..

පංදුක බිලිංකම


## KELANIYA UNIVERSITY ASSOCIATION OF AUSTRALIA

**The committee members invite all past graduates and staff members to be present at the 1st 'Annual General Meeting of KUAA'**

**DATE: 19th July 2008**
**TIME: 6.30 PM to 10.00 PM**
**VENUE: 731, Waverley Road, Glen Waverley**
**(Residence of Fenella Jayawickreme)**

**Please bring along a dish (i.e. finger food, soft drink) to be shared with others.**

**Please try your best to be present, as this is the very first general Meeting of KUAA.**
**For further details contact:**
**Fenella Jayawickrama—8502 0387/ mobile - 0422 430806**
**Jayanthi Welikala 9807 2034**


## පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරයේ වෙසක් උත්සවය



පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරයේ වෙසක් උත්සවය නිමිත්තෙන් දර්ශණීය වෙසක් කූඩුවක් මැයි මස 24 සිට 26 දක්වා ප්‍රදර්ශනය කරන ලදී. පරිවාර කූඩු 81 සහිත කැරකෙන කූඩුවක් වූ මෙහි විශේෂත්වය වනුයේ ශ්‍රී ලාංකික කැටයම් කලාව උපයෝගී කරගනිමින් සියළුම කූඩු නිර්මානය කර තිබීමය. තවද ප්‍රධාන කූඩුව හැර අනෙකුත් සියළුම කූඩු සැකිල්ලක් රහිතව කඩදාසි සහ කාඩ්බෝඩ් භාවිතයෙන් නිමවා ඇත. පරිවාර කූඩු එකිනෙකට විරුද්ධ දිශාවනට භ්‍රමනයවීමට යාන්ත්‍රිකව සම්බන්ධකරවීෙ මන් මෙහි අලංකාරත්වය තවදුරටත් වැඩිවී ඇත. විහාරාධිපති ගරු පූජ්‍ය බේරුවල සෝභිත නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් ඉදිවුනු මෙම කූඩුව බටහිර ඔස්ට්‍රේලියාවේ ප්‍රදර්ශනය වූ ප්‍රථම මෙවන් නිර්මානය ෙ ස් සැලකේ.

මෙය ගොස්නෙල් නගරයේ පුරපතිනිය ඔස්වන් සර්ල් මැතිනිය අතින් විවෘ ත වුන අතර මෙම අවස්ථාව සඳහා බටහිර ඔස්ට්‍රේලියාවේ අගරදගුරු ගරු රොජර් හර්ෆ්ට් පියතුමා සහ ශ්‍රී ලංකා කොන්සල් ෆ්‍රෑන්ක් ක්‍රෝලි මැතිතුමාද සහභාගි විය.

වෙසක් උත්සවය සඳහා ශ්‍රී ලංකාවෙන් වැඩම කල මොරටුව රාවතාවත්ත බෞද්ධ මධ්‍යස්ථානාධිපති, කමමට්ඨාචාර්ය, පූජ්‍ය දොඩන්ගොඩ අස්සජී අධිකරණ සංඝනායක හිමි, හැඩිගල්ලේ විමලසාර හිමි, ෙ හට්ටිපොල සීවලී හිමි ද මෙම අවස්ථාවට සහභාගි වූහ.



මෙම පහන් කූඩුවෙහි නිර්මානය සහ කැටයම් කලා චන්ද්‍රදාස ෙ හවගේ මහතා අතින් සිදුවූ අතර සම්බන්ධීකරනය අනුර විජේවර් ධන මහතා අතින් සිදුවින.

මෙයට සමගාමීව 6වෙන වරටත් බත් දන්සැලක් පැවැත්වුනු අතර දහම් පාසැල් සිසු සිසුවියන් විසින් භක්ති ගීත ගායනයක්ද පවත්වන ලදී.

## ක්වීන්ස්ලන්ත බෞද්ධ විහාරයේ බුද්ධ ප්‍රතිමා වහන්සේ නිරාවරණය කිරීම





බ්‍රිස්බේන්, ගුඩිනා හී ක්වීන්ස්ලන්ත බෞද්ධ විහාරයට හේමා අලහකෝන් මහත්මිය ඇතුළු දරුවන් විසින් ශ්‍රී ලංකාවේ සිට වැඩමවා පරිත්‍යාග කළ , හෙළ කලාකරුවන් විසින් තනි ගලෙන් කැටයමට නගා ඔප් නංවන ලද, අඩි පහක් පමණ උසැති සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ නිරාවරණය කිරීම හා ප්‍රථම මල්, පහන්, ගිලන්පස බුද්ධ පූජාව වොෂින්ටන් බෞද්ධ විහාරාධිපති මහරගම ධම්මසිරි නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ ගේ සහ අතිපූජ්‍ය ත්‍රිකුණාමලේ ආනන්ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මූලිකත්වයෙන්, ක්වීන්ස්ලන්ත බෞද්ධ විහාරාධිපති පූජ්‍ය සිටිනාමළුවේ සුගතසාර, පූජ්‍ය නත්තරන්පොත චන්දිම, පූජ්‍ය විලගම ආනන්දසිරි, පූජ්‍ය රජවැල්ලේ සුභූති ස්වාමීන් වහන්සේලාගේ සහ තායිවාන් ජාතික ධම්මචාරෝ ස්වාමීන් වහන්සේ ඇතුළු දායක පින්වතුන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් අප්‍රේල් මස 05 වෙනි සෙනසුරාද සිදු කෙරිණ.